මගේ අංකය - සිආදෙ/3/5/2 –I

චක්‍රලේඛ අංක - 09/2016

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
බම්බලපිටිය.

2016.11. 23

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම අධ්‍යක්ෂවරුන් / නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂවරුන්,
මූලස්ථාන මාණ්ඩලික නිලධාරී,
සියළුම බලකා අණදෙන නිලධාරීන් / පුහුණු පාසල් අණදෙන නිලධාරීන්,
සහ ව්‍යාපෘති භාර නිලධාරීන්

<u>අධිකරණයක් විසින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකු විසින් හෝ සිවිල් ආරක්ෂක සාමාජිකයෙකුට එරෙහිව කටයුතු කරන අවස්ථාවක දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය</u>

උක්ත කරුණට අදාලව ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදයේ සඳහන් වන මතු දැක්වෙන කරුණු සම්බන්ධව ඔබගේ අවධානය යොමු කරවමි.

02. "රජයේ නිලධරයකුට විරුද්ධව අධිකරණ කටයුතු ආරම්භ කිරීමේ එක් පියවරක් වශයෙන් අදාළ නිලධරයා පොලිස් හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයකු හෝ විසින් අත් අඩංගුවට ගෙන ඇති අවස්ථාවක දී හෝ අධිකරණය ඉදිරියේ නීති කෘත්‍යයන් ආරම්භ කිරීමට පෙර රක්ෂිත බන්ධනාගාර ගතකොට ඇති අවස්ථාවක දී හෝ එම නිලධරයාට එම කාලය ආවරණය වන පරිදි අනිවාර්ය නිවාඩු ලබා දිය යුත්තේ ය. (27:7)

03. පොලිස් දෙපාර්තමේන්තුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයකු හෝ විසින් අත්අඩංගුවට ගනු ලැබූ රජයේ නිලධරයකු එම අත්අඩංගුවෙන් නිදහස් කරනු ලැබ ඇති විටක දී ඔහු නැවත සේවයේ පිහිටුවිය යුතු ය. එසේ වුව ද එම නැවත සේවයේ පිහිටුවීම මගින් විනය බලධරයා විසින් පැවැත්වීමට නියමිතව ඇති විධිමත් විනය පරීක්ෂණයට බාධාවක් ඇති වන්නේ නම් අදාළ චූදිත නිලධරයා නැවත සේවයේ නොපිහිටුවා ඔහුගේ වැඩ තහනම් කළ යුතු ය. (27:8)

04. නඩු පැවරීමට පෙරාතුව රක්ෂිත බන්ධනාගාර ගතකොට ඇති නිලධරයකු ඇප පිට නිදහස් කර ඇති අවස්ථාවක දී එම නිලධරයා නැවත රාජ්‍ය සේවයේ පිහිටුවීම රජයේ සේවයේ යහපතට අහිතකර නොවන්නේ යැයි විනය බලධරයා නිගමනය කරන අවස්ථාවක දී ඔහු නැවත සේවයේ පිහිටුවිය යුතු ය. ඔහු නැවත සේවයේ පිහිටුවීම රජයේ සේවයට අහිතකර වන්නේ යැයි විනය බලධරයා සෑහීමකට පත් වන්නේ නම් ඔහු තව දුරටත් අනිවාර්ය නිවාඩු මත තැබිය යුත්තේ ය. එසේම නිලධරයාට විරුද්ධව විධිමත් විනය ක්‍රියා පටිපාටියක් ආරම්භ කිරීමට විනය බලධරයා තීරණය කර ඇති අවස්ථාවක දී සේවයේ පිහිටුවීම එසේ පවත්වනු ලැබීමට අපේක්ෂිත විධිමත් විනය ක්‍රියා පටිපාටියට බාධාවක් වන්නේ නම් අවස්ථානෝචිත පරිදි ඔහුගේ වැඩ තහනම් කළ යුතු ය. (27:9)"

05. "අපරාධමය ක්‍රියාවන්හි නියැලෙන සිවිල් ආරක්ෂක පුද්ගලයින්ට එරෙහිව කටයුතු කිරීම" මැයෙන් 2016.05.07 දිනැතිව නිකුත් කරන ලද දෙපාර්තමේන්තු චක්‍රලේඛ 04/2016 තව දුරටත් ක්‍රියාත්මක වන අතර ඒ අනුව ඉදිරියේදී උක්ත සඳහන් අවස්ථාවලදී දක්වා ඇති ක්‍රමවේදයෙන් බැහැරව තම අභිමතය පරිදි වැටුප් රහිත නිවාඩු ලබා දීම, සේවය අත්හිටුවීම හෝ සේවය අත්හිටුවීම සඳහා නිර්දේශ කිරීම, වැටුප් ගෙවීම නතර කිරීම සඳහා නිර්දේශ කිරීම සහ සේවයෙන් පහ කිරීම නොකළ යුතු බවත් දන්වා සිටිමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
අංක 23, දුම්රියපොළ පාර,
බම්බලපිටිය, කොළඹ 04.